## බළන්ගොඩ නගර සභාව
## 2022-04-21 වන දිනැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2022.04.21**

**වේලාව - පෙ.ව. 10.30**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති ඩබ්.ඒ. වසන්ත ගුණරත්න මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින විශේෂ මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා |
| 2. ගරු උප සභාපති | එම්.ටී.එම්.රුමී මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | නිමල් කරුණාරත්න මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | ලාල් ගලප්පත්ති මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්.විමලසිරි මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | රවීන්ද්‍ර සමන් කවිරත්න මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රීනී | ජී. චන්ද්‍රලතා මැතිතුමිය |

**නිලධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | ඩී.එම්.ජේ.යූ.ධර්මරත්න මයා |

ගරු සභාපතිතුමන් විසින් මෙදින විශේෂ මහ සභාව සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා, ගරු නාගරික මන්ත්‍රීවරුන් ඇතුළු සියළුම දෙනා පිළිගනිමින් ආගම සිහි කිරීමෙන් අනතුරුව ගරු සභාවේ වැඩ කටයුතු ආරම්භ කළ අතර, බළන්ගොඩ නගර සභාව සඳහා අවශ්‍ය ජෙනරේටරයක් මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් විවෘත කිරීම හා සුදුසු සැපයුම්කරුවෙකු තෝරා ගැනීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීම වෙනුවෙන් මෙදින විශේෂ මහ සභාව පවත්වන බව පවසන ලදී.

**01.** බළන්ගොඩ නගර සභාව සඳහා අවශ්‍ය ජෙනරේටරයක් මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් විවෘත කිරීම හා සුදුසු සැපයුම්කරුවෙකු තෝරා ගැනීම

බළන්ගොඩ නගර සභාව සඳහා අවශ්‍ය ජෙනරේටරයක් මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් විවෘත කිරීම හා සුදුසු සැපයුම්කරුවෙකු තෝරා ගැනීම සඳහා ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රිනි ජී. චන්ද්‍රලතා මැතිතුමියගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත්කරන ලදි.

මිළ ගණන් විවෘත කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී ලාල් ගලප්පත්ති මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කර ගන්නා ලදි.

එහි දී අනුමත කරන ලද පහත සඳහන් තීරණය ගරු සභාපතිතුමන් විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදි.

- බළන්ගොඩ නගර සභාව සඳහා අවශ්‍ය ජෙනරේටරයක් මිලදී ගැනීම වෙනුවෙන් මිල ගණන් මෙට්‍රෝපොලිටන් ආයතනයෙන් පමණක් ලැබී තිබූ බැවින් එම ලංසු ලියවිලිවල පිරිවිතර පරීක්ෂා කර බලා නිර්දේශ ලබා දීම සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවට යොමු කිරීම සුදුසු බව ටෙන්ඩර් මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

ඒ අනුව ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කරන ලද ඉහතින් ලබාගත් තීරණය ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරමින් ගරු සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්. විමලසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

අනතුරුව අද දින ගරු සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු උප සභාපතිතුමා ඇතුළු නාගරික මන්ත්‍රී මණ්ඩලය හා කාර්ය මණ්ඩලය සඳහා ස්තුතිය පුදකරමින් පෙ.ව 11.05 ට පමණ විශේෂ මහ සභාවේ කටයුතු අවසන් කරන ලදි.

ඩබ්.ඒ.වසන්ත ගුණරත්න,
සභාපති,
බළන්ගොඩ නගර සභාව